# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2098/27 - 2018 නොවැම්බර් මස 23 වැනි සිකුරාදා - 2018.11.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත**

2 වැනි වගන්තිය යටතේ නියමය

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් හා ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, මෙහි උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වෙළඳ භාණ්ඩය සම්බන්ධයෙන් එම උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහන්වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණ මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක්, මෙම නියමය මගින් පනවමි.

මෙම නියමය 2018 නොවැම්බර් මස 24 වැනි දින සිට මාස 6ක් දක්වා වූ කාල සීමාවක් සඳහා, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන වලට යටත්ව, වලංගුව පැවතිය යුතුය.

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ පනවන ලද 2018.09.07 දිනැති අංක 2087/76 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රය* මගින් සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක 0713.10.10 සහ 0713.10.20 යටතේ වන මෑ වර්ගයේ ඇට (වටානා) සඳහා ප්‍රකාශිත අදාල නියමයන් 2018 නොවැම්බර් මස 24 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරමි.

මහින්ද රාජපක්ෂ,
මුදල් හා ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍ය.

2018 නොවැම්බර් මස 23 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ දී ය.

**උපලේඛනය**

| *I වැනි තීරය* | | | | *II වැනි තීරය* |
|---|---|---|---|---|
| *වෙළඳ භාණ්ඩය* | | | | *විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද* |
| | *සං. ව. ශීර්ෂය* | *සං. ව. සංකේතය* | *විස්තරය* | |
| 01 | 07.13 | 0713.10.10 | සම්පූර්ණ - මෑ වර්ගයේ ඇට (පීසම් සැටයිවම්) | කි. ග්‍රෑමයට රු. 5.00 |
| | | 0713.10.20 | පියලි කළ - මෑ වර්ගයේ ඇට (පීසම් සැටයිවම්) | කි. ග්‍රෑමයට රු. 8.00 |

12- 1642

1A - PG 4319 — 532 (2018/11) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*